CPA
Centre for Policy Alternatives
විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය
மாற்றுக் கொள்கைகளுக்கான நிலையம்

# ජනාධිපති රනිල් වික්‍රමසිංහ විසින් ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ නිකුත් කරන ලද රැඳවුම් නියෝග භාවිතය පිළිබඳ ප්‍රකාශය

2022 අගෝස්තු 24 වන දින

ත්‍රස්තවාදය වැළැක්වීමේ (තාවකාලික විධිවිධාන) පනතේ (Prevention of Terrorism (Temporary Provisions) Act - PTA) 9 වැනි වගන්තිය යටතේ අන්තර් විශ්වවිද්‍යාල ශිෂ්‍ය බලමණ්ඩලයේ කැඳවුම්කරු වසන්ත මුදලිගේ මෙන්ම හශාන්ත ජීවන්ත ගුණතිලක සහ පූජ්‍ය ගල්වැව ශ්‍රී ධම්ම ස්වාමීන් වහන්ස යන පුද්ගලයන් දින 90 ක කාලයක් රඳවා තබා ගැනීමට අවසර දීම සම්බන්ධයෙන් රැඳවුම් නියෝග තුනක් නිකුත් කිරීමට ආරක්ෂක අමාත්‍යවරයා වශයෙන් ජනාධිපති රනිල් වික්‍රමසිංහ විසින් ගෙන ඇති පියවර පිළිබඳව විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය (Centre for Policy Alternatives - CPA) දැඩි ලෙස කනස්සල්ලට පත්ව සිටී. මෑත කාලීන විරෝධතාවලට සම්බන්ධ යැයි කියන මෙකී සැකකරුවන් තිදෙනා රඳවා තබා ගැනීමට ගත් මෙම පියවර වූ කලී, දශක කිහිපයක් පුරාවට අහෝසි කරන ලෙසට අඛණ්ඩවම ඉල්ලීම් කරනු ලබන ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත විධායකය විසින් අවභාවිත කිරීම සම්බන්ධයෙන් වන තවත් එක් උදාහරණයකි. එපමණක් නොව, 'අරගලයට' සම්බන්ධ වීම පදනම් කර ගනිමින් සිදු කර ඇති මෙම රඳවා තබා ගැනීම වනාහි එක්සත් ජාතික පක්ෂ - ශ්‍රී ලංකා පොදුජන පෙරමුණු ආණ්ඩුව විසින් විරෝධතාකරුවන් ඉලක්ක කර, විසම්මුතිය නිශේධනය කිරීම සඳහා භයංකර බලපෑමක් ඇති කිරීමට දරන තවත් උත්සාහයක් බව පෙන්නුම් කෙරේ.

ත්‍රස්තවාදය වැළැක්වීමේ පනතේ 9 වැනි වගන්තිය ප්‍රකාරව මාස 3ක් දක්වා වූ කාලසීමාවක් සඳහා රැඳවුම් නියෝග නිකුත් කිරීමට බලය ආරක්ෂක අමාත්‍යවරයාට ලබා දෙනු ලබන අතර, ඉන් පසුව තව දුරටත් වරකට මාස 3 ක් බැගින් මාස 12 ක් දක්වා එකී රඳවා තබා ගැනීමේ කාලය දීර්ඝ කරනු ලැබිය හැකිය. ජනාධිපතිවරයා වර්තමානයේ ආරක්ෂක අමාත්‍යවරයා වේ.

වර්ෂ 1979 දී සම්මත කරන ලද, ත්‍රස්තවාදය වැළැක්වීමේ පනතේ 29 වන වගන්තියේ විධිවිධාන ප්‍රකාරව ගත් කල, එකී නීතිය ක්‍රියාත්මක වීම ඇරඹි දින සිට වසර තුනක් දක්වා වූ කාලයක් සඳහා පමණක් වලංගු වන බව මුලින් පෙන්වා දෙන ලදී. කෙසේ වෙතත්, එම වගන්තිය වර්ෂ 1982 දී අහෝසි කරන ලද අතර, එමගින් එකී නීතිය ස්ථිර නීතියක් බවට පත් කරන ලදී. දශක හතරකට පසුව, ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත, විවේචකයන් සහ සුළු ජාතීන් සම්බන්ධයෙන් වධහිංසා පැමිණවීම්, බිය ගැන්වීම් සහ හිරිහැර කිරීම් ආදිය ඉලක්ක කර කාලයෙන් කාලයට බලයට පත්වන ආණ්ඩු විසින් භාවිත කරනු ලබන නීතියක් බවට සාක්ෂි ඇති ලේඛනගත සිද්ධීන් ඔස්සේ පෙන්වා දෙනු ලැබිය හැකිය.

වර්ෂ 1979 දී, ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත පාර්ලිමේන්තුව විසින් සම්මත කරනු ලබන අවස්ථාව වන විට, එය 'හදිසි පනතක්' වශයෙන් ශ්‍රේෂ්ඨාධිකරණයට යොමු කරන ලද අතර, එය පාර්ලිමේන්තුවේ 2/3 ක බහුතර ඡන්දයකින් සම්මත කරනු ලබන බවට වන වගකීම එවකට පැවති රජය විසින් භාර ගන්නා ලද බව ද විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය විසින් මෙහිදී සටහන් කරනු ලැබේ. එහි ප්‍රතිඵලයක් වශයෙන්, ශ්‍රේෂ්ඨාධිකරණය විසින් විමසා බලන ලද්දේ ත්‍රස්තවාදය වැළැක්වීමේ පනතේ කිසියම් ප්‍රතිපාදනයක් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් සුරක්ෂිත කර ඇති විධිවිධාන උල්ලංඝණය කරනු ලබන්නේ ද යන්න සම්බන්ධයෙන් පමණි (එනම්, පනත් කෙටුම්පතට නීතියක් බවට පත් වීමට ජනමත විචාරණයක් අවශ්‍ය ද යන්න පිළිබඳවය). එහිදී, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාමය ප්‍රතිපාදන සමඟ නොගැලපෙන තත්ත්වයක් පැවති නමුදු ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත නීතියක් බවට පත් විය.

තවද, වර්ෂ 2017 දී, වත්මන් ජනාධිපති වික්‍රමසිංහ එවක අග්‍රාමාත්‍යවරයාව සිටියදී, ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ අත්අඩංගුවට ගැනීම් අත්හිටුවන බව ශ්‍රී ලංකා රජය විසින් නිවේදනය කරන ලද බව ද විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය විසින් මෙහිදී සඳහන් කර සිටී. 'මූලික අයිතිවාසිකම් නීත්‍යානුකූලව ක්‍රියාත්මක කිරීමට බාධාවක් වන අයුරින් ත්‍රස්තවාදයට එරෙහි නීති අනිසි ලෙස භාවිත නොකිරීමටත්, එසේ සිදු කිරීම වූ කලී ප්‍රජාතන්ත්‍රවාදයේ සහ යහපාලනයේ මූලධර්මවලට පටහැනි තත්ත්වයක් වන බවටත් එමගින් යුක්තියේ අරමුණු පරාජය කරනු ඇති බවටත් සහතික වීමේ අවශ්‍යතාවය පිළිබඳව රාජ්‍යය අවධානයෙන් සිටින බව' එවකට අග්‍රාමාත්‍යවරයා විසින් ප්‍රතිපත්ති ප්‍රකාශයක් ලෙස ද පිළිගන්නා ලද්දේ කිසිදිනක සම්මත නොවූ එවක යෝජිත ප්‍රතිත්‍රස්ත පනත් කෙටුම්පත ඉදිරිපත් කිරීමේදී ය. විරෝධතාකරුවන් ඉලක්ක කර විසම්මුතිය වැළැක්වීමේ නවතම පියවර ඇතුළුව, ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත වර්තමානයේ භාවිත කරනු ලබන ආකාරයට අනුව බලන කල ඉහත කී අන්දමේ ප්‍රකාශය ඊට පටහැනි බව මනාව විද්‍යමාන වේ.

වරදක් කළ බවට සැක කෙරෙන ඕනෑම පුද්ගලයකු සම්බන්ධයෙන් අදාළ විමර්ශන කටයුතු කිරීම සඳහා භාවිත කරනු ලැබිය හැකි නීති ඕනෑ තරම් ශ්‍රී ලංකාවේ පවතී. එබැවින් විරෝධතාකරුවන් ඉලක්ක කර ඔවුන්ගේ ක්‍රියාව ත්‍රස්තවාදී ක්‍රියාකාරකම් වලට සමාන කිරීමට ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත භාවිතා කිරීම අතිශයින්ම භයානක, තැතිගන්වනසුලු සහ සම්පූර්ණයෙන්ම අසමානුපාතික අන්දමේ බලය භාවිත කිරීමේ ක්‍රියාවක් බව පැහැදිලි වේ. මෙම තත්ත්වය මගින්, පෙර නොවූ විරූ ආර්ථික අර්බුදයකට මුහුණ දී සිටින ශ්‍රී ලංකාවේ සන්දර්භය තුළ පවතින තත්ත්වය, තවදුරටත් උග්‍ර වන අතර රජය විසින් සියලු පුරවැසියන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමට සහ ප්‍රවර්ධනය කිරීමට සියලු පියවර ගැනීම අත්‍යවශ්‍ය වේ.

මේ අනුව, රැඳවුම් නියෝග වහාම අවලංගු කරන ලෙසත්, ශ්‍රී ලංකාවේ ජාත්‍යන්තර බැඳීම්වලට අනුකූලව, ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත අවලංගු කරන ලෙසත් විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය විසින් ජනාධිපතිවරයාගෙන් ඉල්ලා සිටී. පුරවැසියන් ස්වකීය මූලික අයිතිවාසිකම් ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් පුද්ගලයන්ට හිරිහැර කිරීම, බිය ගැන්වීම සහ ඉලක්ක කිරීම වළක්වන ලෙස විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය විසින් තව දුරටත් බලධාරීන්ගෙන් ඉල්ලා සිටී. නීතියේ ආධිපත්‍යය මෙන්ම ප්‍රජාතන්ත්‍රවාදී භාවිතයන් සහ ඊට අදාළ ක්‍රියාවලීන් තහවුරු කිරීමට නව රජය අවංකව කැපවී සිටින්නේ නම්, ඒ අන්දමින් කටයුතු කිරීම පුරවැසියන් සහ ජාත්‍යන්තර ප්‍රජාව අතර විශ්වාසය ඇති කිරීමේ තීරණාත්මක පියවරක් වනු ඇත.


Centre for Policy Alternatives (Guarantee) Limited | 6/5, Layards Road, Colombo 5, Sri Lanka
Tel: ++94112081384, +94112081385, +94112081386 | Fax: +9411 2081388 | Email: info@cpalanka.org | Web: www.cpalanka.org